# බෞද්ධ දර්ශනයේ පරිසර සංරක්ෂණ සංකල්පය හා නූතන පරිසර නීතිය අතර ඇති සබඳතාවය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

නිසංකා ජයරත්න[1]
උදේනි හේරත් [2]

## හැඳින්වීම

පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් බෞද්ධ දර්ශනයේ අන්තර්ගත කරුණු සහ නූතන පරිසර නීතියේ පරිසර සංරක්ෂණය පිළිබඳ පවතින නීතිමය ප්‍රතිපාදන පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම අධ්‍යයනයෙහි මූලික පරමාර්ථය වේ. පරිසර සංරක්ෂණය පිළිබඳව බෞද්ධ දර්ශනය විශේෂ අවධානයක් යොමු කරන අතර පරිසරය සම්බන්ධයෙන් මිත්‍රශීලී ආකල්පයකින් ක්‍රියා කළ යුතු බව දක්වයි. ජලය, වාතය, පස සංරක්ෂණය කිරීම , නිශ්ශබ්දතාවය ආරක්ෂා කිරීම මෙන්ම කසළ කළමණාකරණය කිරීමේ අවශ්‍යතාවය බුදු දහම විසින් අවධාරණය කරයි. පරිසරය සම්බන්ධව බුදු දහමේ පවත්නා ආකල්පය නූතන පරිසර නීතිය හා කෙසේ සමපාත වන්නේ ද? යන්න පිළිබඳව මෙම අධ්‍යයනය මගින් අවධානය යොමු කර ඇත.

වර්තමාන සමාජය මුහුණ දී සිටින ප්‍රබලතම ගැටළුවක් වන්නේ පරිසර දූෂණයයි. ඒ ඔස්සේ ජලය, වාතය, ගොඩබිම, ශබ්ද දූෂණය මගින් බරපතල සමාජ පාරිසරික ව්‍යසනයන් නිර්මාණය වී ඇත. අධික කාර්මීකරණය, නාගරීකරණය සම්පත් අධිභාවිතය ඔස්සේ පරිසර දූෂණය තීව්‍ර වී ඇති අතර අධික වනාන්තර විනාශය, පොසිල ඉන්ධන දහනය හරහා කාන්තාරකරණය සිදුවීම, දේශගුණ විපර්යාස ගෝලීය උණුසුම ඉහල යාම, මුහුදු ජල මට්ටම ඉහල යාම, අම්ල වර්ෂා, ඕසෝන් ස්ථරය සිදුරු වීම ආදී ප්‍රබල පාරිසරික ගැටලු නිර්මාණය වී ඇත. පරිසරය සහ තිරසර සංවර්ධනය පිළිබඳ කරුණු දැක්වූ ඇමෙරිකානු පරිසරවේදී *James Gustave Speth*, පරිසරය ආරක්ෂා කිරීම සඳහා පරිසර මූලධර්ම සමග ආගමික සංස්කෘතික වටිනාකම් ගැලපිය යුතු බව *Red sky at morning* කෘතියේ දක්වා ඇත.

නූතන පරිසර නීතිය තුළ පරිසර සංරක්ෂණයට අදාළ විධි විධාන ජාත්‍යන්තර හා ජාතික වශයෙන් හඳුනා ගත හැකිය. ජාත්‍යන්තර නීතිය යටතේ

---

1 නීති අධ්‍යයන අංශය, සමාජ අධ්‍යයන අංශය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. nisanka1984@gmail.com

2 නීති අධ්‍යයන අංශය, සමාජ අධ්‍යයන අංශය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. udeni.herath@yahoo.com

ජාත්‍යන්තර සමුළු, ජාත්‍යන්තර සම්මුති සහ ප්‍රකාශන නඩු තීන්දු නීතිය හරහා පරිසර නීතිය සංවර්ධනය වී ඇත. ජාතික වශයෙන් දේශීය නීතිය තුළ ජාතික පාරිසරික පනත සහ සෙසු පරිසර පනත් සමග නඩු තීන්දු නීතිය ඇසුරින් පරිසර නීතිය ගොඩ නැගී ඇත. බුදු දහමේ ජලය, වාතය, පස සංරක්ෂණය සම්බන්ධව දක්වන කරුණු ජාතික පාරිසරික පනතේ 23 වගන්තියේ *G, H, I, J, L,M* යන උප වගන්ති ඔස්සේ ද ශබ්ද දූෂණය පාලනය සඳහා *23 N, O, P* යන උප වගන්ති ද කසළ කළමණාකරණය පිළිබඳ *23 Q* උප වගන්තිය තුළද නීති ගත කොට ඇති ආකාරය හඳුනා ගත හැකිය.

### අරමුණු

"බෞද්ධ දර්ශනයේ පරිසර සංරක්ෂණ සංකල්පය හා නූතන පරිසර නීතිය අතර ඇති සබඳතාවය" පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයේ දී පාදක කරගනු ලැබූ අරමුණු ආකාර තුනකින් සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

01. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ ප්‍රථම සමයාන්තර පරිසරවේදියාණෝ ලෙස පරිසර සංරක්ෂණය පිළිබඳ දේශනා කළ දහම් කරුණු සහ බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන් විසින් දේශනා කරන ලද දහම් කරුණු නූතන පරිසර නීතිය සමග සමරූපී වන ආකාරය හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථයයි .

02. බුදු දහමේ පරිසර සංරක්ෂණ සංකල්පය නූතන පරිසර නීතියට අනුගත කොට ඇති පරිමාණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මෙහි දෙවන අරමුණ ලෙසින් දැක්විය හැකිය.

03. නූතන නීතිය සමග බුදුදහම සම්බන්ධ කිරීම හරහා මිනිසුන්ගේ පරිසර සංරක්ෂණය පිළිබඳ ආකල්ප ගොඩ නැංවීම සිදු කළ හැකි ආකාරය අධ්‍යයනය කිරීම මෙහි තෙවන අරමුණ ලෙසින් දැක්විය හැකිය.

### පර්යේෂණ ක්‍රම වේදය

නූතන පරිසර නීතිය සමග බුදුදහම සම්බන්ධ කිරීම හරහා මිනිසුන්ගේ පරිසර සංරක්ෂණය පිළිබඳ ආකල්ප ගොඩ නැංවීම සිදු කළ හැකිද යන පර්යේෂණ ගැටළුව සනාථ කර ගැනීම උදෙසා තුලනාත්මක ක්‍රමවේදය භාවිතා කරනු ලැබීය. පනත්, ආඥා පනත්, රෙගුලාසි, සම්මුති, ප්‍රකාශන හා සාහිත්‍යය පරිශීලනය මුල් කර ගනිමින් ද්විතීයික දත්ත රැස් කිරීම සිදු කෙරුණ අතර ප්‍රාථමික දත්ත සම්පාදනය සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම වශයෙන් යොදා ගැනුණි.

### අධ්‍යයන ප්‍රතිඵල

මූලිකව කරන ලද අධ්‍යයනයේදී බුදු දහමේ අන්තර්ගත වන පරිසර සංරක්ෂණයට අදාළ කරුණු සංකල්ප නූතන පරිසර නීතිය සමග සැහෙන දුරකට

සමපාත වන බව පැහැදිලි විය. විශේෂයෙන් ජාත්‍යන්තර පරිසර නීතිය සම්මුති ප්‍රකාශන සේම ජාතික වශයෙන් ජාතික පාරිසරික පනත තුළ අන්තර්ගත කරුණු පරිසර සංරක්ෂණයට අදාළ විධි විධාන බුදුදහමේ දැක්වෙන කරුණු සමග ඉතා සමීප බව පැහැදිලි විය.

එසේම පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ආකල්ප වර්ධනයක් ඇති කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදනද අභිබවා බුදුදහමේ එන ඉගැන්වීම් ඉවහල් වන බව තහවුරු විය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ධම්මජෝති, බෙලිගල්ලේ .(1993). *බෞද්ධ ආර්ථික දර්ශනය.* කර්තෘ ප්‍රකාශන.

පියනන්ද,වල්පොල සහ ස්ටීවන්ග් ලෝන්ග් (2011). *මහ රහතුන් වදාල බුද්ධ චරිතය.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ඔබේ පරිසර අයිතිය.* (2002). කොළඹ 10: සීමාසහිත පාරිසරික පදනම.

*ජාතික පාරිසරික පනත.* (1980). කොළඹ: අංක 47,රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

Guneratne,Camena (2004). *Environmental Law.* Blok 01&02. Nawala: The Open University of Sri Lanka.